# පක්ෂි දඩයම සඳහා භාවිත පැරණි දඩයම් ක්‍රම පිළිබඳ අධ්‍යයනයක් (ගුරුබැවිලාගම ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇසුරෙන්)

# A Study on Ancient Bird hunting methods (Related to Grama Niladhari Division of Gurubawilagama)

දෝතළුඔය නාරද හිමි


## Abstract

Traditional hunting methods in ancient Sri Lanka can be identified island wide. Since in the past, different hunting methods were used for hunting animals by hunters. Meanwhile hunting traps and tools are very important for hunting animals. however, Today these hunting methods are very rare. The villagers avoid even training the new generation such hunting methods. This research had been limited to each hunting methods of birds. This survey has been selected in Gurubawilagama Gramaniladari division which is located in Rathnapura district. The research problem here was to investigate what do hunting methods used for hunting birds in study area and how to use those methods? And also this research paper is based on qualitative research methodology. As a result of this research could identified eight hunting methods for hunting birds. There are five hunting traps and three tools among the methods. La idala, Pamala, Adi Ugula, Kuda ataweema and Kulla ataweema are the hunting traps while Gatalanuwa, Galdunna and Katapolla are the hunting tools. Beside the Katapolla others can be introduced traditional hunting system in Sri Lanka. Among this hunting methods beside the La Idala, other can be hunted only one bird at on time. These methods had been used in chenas and paddy fields. But these

chenas and paddy field cultivation can not seen in this area in the present. A summary it must be said that the above hunting methods were very useful in hunting birds in the study area. Sri Lanka jungleFowl (Galloperdix lafayettii), Jungle bush Quail (perdicula asiatica), White- breasted Waterhen (Amaurornis phoenicurus), Sri Lanka Woodpigeon (C. torringtoni), and Spotted Dove (S Chinensis), can be seen as common hunting brids.

**Keywords:** Bird Hunting, Traps, Gal Dunna, Gatalanuwa, La idala

**හැඳින්වීම**

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම දඩයමට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. දඩයම් කිරීම (Hunting) සහ එකතු කිරීම (Gathering) යන ද්විත්වය ඈත අතීතයේ ජීවත් වූ මිනිසාගේ යැපීම් ක්‍රමය විය. දඩයම් කිරීම යන්නෙන් අදහස් වන්නේ අල්ලාගැනීම හෝ මරණයට පත් කිරීමයි. ඒ සඳහා විවිධ උපක්‍රම ඈත අතීතයේ සිට ම භාවිත කර තිබේ. ප්‍රාග් ඓතිහාසික මානවයන් විවිධ මාදිලියට අයත් ගල් ආයුධ මෙන් ම සත්ත්ව හෝ මානව අස්ථිවලින් සැකසූ ආයුධ මේ සඳහා යොදාගෙන ඇති බවට සාධක ලොව පුරා හමු වී තිබේ. බුද්ධි වර්ධනයේ දියුණුවත් සමඟ යකඩ තාක්ෂණයට හුරු වූ මිනිසා ඉතා දියුණු මෙවලම් නිර්මාණය කිරීමට ද සමත් විය. පූර්ව ඓතිහාසික යුගය වන විට සංවිධානාත්මක දඩයම, කෘෂිකර්මාන්තය, ශාක හා සත්ත්ව ගෘහාශ්‍රිතකරණය, සීමිත ධීවර කර්මාන්තය, ශිල්පීය භාණ්ඩ නිෂ්පාදනය ආදියට මිනිසා හුරු වී තිබේ. තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීම පිණිස සතුන් දඩයම් කිරීමට අවශ්‍ය වූ පසු සතුන් වෙසෙන ස්ථානයන් කරා ගොස් තම අරමුණු ඉටු කර ගත් අතර එසේ දඩයම් කිරීමේ දී ඉතිරි වූ කුඩා පැටවුන් තම වාසස්ථාන වෙත රැගෙනවිත් පෝෂණය කරන්නට විය. එය සත්ත්ව ගෘහාශ්‍රිතකරණයේ එක් ක්‍රමවේදයකි. එම සත්ත්වයන් එදිනෙදා ජීවිතයේ ආරක්ෂාව, හුරතලය, ගමන් අවශ්‍යතා හා බර ඇදීම ආදී විවිධ ක්‍රියාකාරකම් සඳහා යොදාගන්නට විය. ඓතිහාසික යුගයේ දී රචනා වූ සාහිත්‍ය

මූලාශ්‍රයවල සත්ත්ව දඩයම සඳහා යොදාගන්නා ලද ක්‍රමවේද පිළිබඳව කරුණු දක්වේ. මෙම පර්යේෂණය මඟින් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරාගන්නා ලද ප්‍රදේශයේ පක්ෂි දඩයම සඳහා යොදාගෙන ඇති දඩයම් ක්‍රමවේද පිළිබඳ අධ්‍යයනය කර තිබේ.

**පර්යේෂණ අරමුණ**

මෙම පර්යේෂණයේ අරමුණ වූයේ අධ්‍යයන ක්ෂේත්‍රයේ පක්ෂි දඩයම සඳහා යොදාගන්නා දඩයම් ක්‍රම පිළිබඳ අධ්‍යයනය කිරීමයි.

**පර්යේෂණ ගැටලුව**

මේ සඳහා පර්යේෂණ ගැටලුව ලෙස අධ්‍යයන ක්ෂේත්‍රයේ පක්ෂි දඩයම සඳහා යොදාගන්නා ක්‍රමවේද මොනවාද? ඒවායේ ප්‍රායෝගික භාවිතය කෙබඳු ද? යන ගැටළු පාදක කර ගෙන තිබේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය භාවිතයට ගෙන තිබේ. මෙහිදී දත්ත රැස්කිරීම ආකාර දෙකක් යටතේ සිදු කරන ලදි. එනම් ප්‍රාථමික දත්ත රැස් කිරීම සහ ද්විතීයික දත්ත රැස් කිරීම වේ. ප්‍රාථමික දත්ත රැස්කර ගැනීමේ දී ක්ෂේත්‍ර අධ්‍යයනය, සටහන් තබාගැනීම, සම්මුඛ සාකච්ඡා ආදිය සිදු කරන ලදි. සම්මුඛ සාකච්ඡා කිරීමේ දී සමස්ථ ග්‍රාමයේ පුද්ගලයන් 2442ක් ජීවත් වන අතර ඔවුන් අතුරෙන් අරමුණු සහගත නියැඳිය ඔස්සේ දීර්ඝ කාලයක් සාම්ප්‍රදායිකව කෘෂිකර්මාන්තයේ නියුතු අවුරුදු 55 ට වැඩි දත්ත දායකයින් 25 දෙනෙකු යොදා ගන්නා ලදි. ද්විතීයික දත්ත රැස්කිරීමේ දී පුස්තකාල ගවේෂණය සිදු කර ඇත. එක්රැස් කරන ලද දත්ත තේමා විශ්ලේෂණ ක්‍රමය භාවිත කර විශ්ලේෂණය කර තිබේ. අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස රත්නපුර දිස්ත්‍රික්කයේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගුරුබැවිලාගම ග්‍රාම නිළධාරි වසම (164/ඊ) තෝරාගෙන තිබේ. මෙම ප්‍රදේශය ගම්මාන නවයකින් (බෙලිගල්ලෙනගම, ගයිරැනගම, ගුරුබැවිලාගම, හොරකඳවලහේන, මැද්දේගොඩ, දෝතළුඔය, ඉළුක්තැන්න, මරතෝට්ටම් වත්ත, වැල්ලවල වත්ත) සමන්විත වර්ග කිලෝමීටර් 14.8 ක භූමි වපසරියකින් යුක්ත ය (සම්පත් පැතිකඩ, 2022: 23).

**සාකච්ඡාව**

ඈත අතීතයේ හේන් ගොවිතැන් හා මඩ ගොවිතැන් මෙම ප්‍රදේශයේ සිදු කර ඇත. ඉන්පසු තේ වගාවේ ව්‍යාප්තිය සමග තත් ප්‍රදේශයේ මිනිසුන් තේ වගාවට නැඹුරු වී තිබේ. එබැවින් හේන් ගොවිතැන හා මඩ ගොවිතැන අභාවයට ගොස් ඇත. වර්තමානයේ මෙම ප්‍රදේශයේ කුඹුරු දක්නට ලැබුන ද බහුල ව ඇත්තේ පුරන් කුඹුරු ය. ගොඩමඩ ගොවිතැනෙන් ජීවත් වූ මිනිසුන් විසින් තම ආහාර අවශ්‍යතා සපුරා ගැනීම හා තම වගාවන් සතුන්ගෙන් ආරක්ෂා කිරීම පිණිස සත්ත්ව දඩයම සිදු කර ඇත. ඒ සඳහා සාම්ප්‍රදායික දඩයම් ක්‍රම බහුලව භාවිත කර තිබේ. සිවුපා සතුන්, පක්ෂීන් හා ජලජ ජීවීන් යන අංශ තුනට ම අයත් සත්ත්වයන් පොදුවේ දඩයම් කර ඇති අතර වර්තමානයේ සාම්ප්‍රදායික ක්‍රමවලින් මිදී විවිධ නව උපක්‍රම අනුගමනය කරමින් සත්ත්වයන් දඩයම් කිරීම මෙම ප්‍රදේශයේ සිදුකරනු ලබයි. එහෙත් සාම්ප්‍රදායික දඩයම් ක්‍රම පිළිබඳ දත් පිරිස් මෙම ප්‍රදේශයේ තව ම ජීවත් වේ. මෙම ප්‍රදේශයේ පක්ෂි දඩයම සඳහා යොදාගෙන ඇති දඩයම් ක්‍රම කිහිපයකි. එනම්,

01. ලා ඉදල භාවිත කිරීම

02. ගැට ලණුව භාවිත කිරීම

03. කැටපලය භාවිත කිරීම

04. ගල් දුන්න භාවිත කිරීම

05. පාමළ භාවිත කිරීම

06. ඇඳි උගුල භාවිත කිරීම

07. කුඩ ඇටවීම

08. කුල්ල ඇටවීම

යන උගුල් ක්‍රම හා උපකරණ ආදියයි.

**01. ලා ඉදල භාවිත කිරීම**



ලා ඉදල මෙම ප්‍රදේශයේ කුරුල්ලන් දඩයම් කිරීම සඳහා භාවිත වූ ජනප්‍රිය දඩයම් ක්‍රමවේදයකි. ලා ඉදල යනු කුඹුරුවල, හේන්වල හෝ ගෙවතුවල කෘතිමව සාදන ලද ගසකි. ලා ඉදල නිර්මාණ කිරීම සඳහා මොර, නා, කොස් වැනි ගසක අත්තක් කපා එය වියළෙන තුරු තැබිය යුතු ය. ඉන්පසු කොළ හැලුන අත්ත ගෙන තමන්ට අවශ්‍ය තැනක සිටුවිය යුතු ය. ඉන් අනතුරුව උණුකරන ලද කොහොල්ලෑ ගෙන එම අතුවල ආලේප කරනු ලබයි. කොහොල්ලෑ දුර්ලභ කාලවලට කැකුණ ඉටි සහ කොහොල්ලෑ ස්වල්පයක් ගෙන එකට උණුකර සිටුවන ලද අත්තේ ආලේප කරනු ලබයි. එවිට එහි වසන කුරුල්ලන් එම ඉටිවලට ඇලෙයි. "ලෑ තැවරීමෙන් හසු වූ කුරුල්ලා ද මොර තලයි. එවිට වෙනත් කුරුල්ලෝ ඒ අසලට නොපැමිණෙයි" ලෙස මෙහි ක්‍රියාකාරීත්වය දක්වා තිබේ (කහඳගමගේ, 2011: 44). නොයෙක් ප්‍රදේශයන් හි මෙම ක්‍රමවේදය "ලෑන් තැබීම" හෝ ''ලෑබ'' ලෙස හඳුන්වයි. ආදිවාසී සමාජය තුළ මෙම ක්‍රමය භාවිත වන්නේ පහත අයුරිනි.

අව් රශ්මියෙන් උණුකොට ගත් දළුක් කිරි හෝ වෙනත් කිරි වර්ග කුරුල්ලන් වැනි කුඩා සතුන් දිය බීමට පැමිණෙන මංකඩවල ඇති අතුපතරෙහි ආලේප කර තබනු ලැබේ. මෙම මැලියම් සහිත අතුවල වැසූ සතුන් ඒවාට ඇලීම නිසා ඉන් ගැලවී යාමට නොහැකිව

එහි ඇලේ. ඉන් පසුව එම සතුන් දඩයම් කර ගනු ලැබේ. මෙම ක්‍රමය බොහෝ දුරට භාවිත කරනු ලබන්නේ වැදි ගැහැණුන් විසිනි. (ජයවර්ධන, 2009: 44)


කහඳගමගේ 1999 දක්වන ආකාරයට හේන් ආශ්‍රිතව මෙය භාවිත වී ඇත්තේ මෙලෙස ය. "දළුක්කිරි පදමට උණුකර සාදාගන්නා මැලියම් හේනේ වගාවන් අතර සිට වූ රිටි අග තවරනු ලබයි. හේනට එන කුරුල්ලෝ රිටිවල වසති. එවිට උන්ට පියාසර කළ නොහැකි වන සේ පා රිටිවල ඇලෙයි" (කහඳගමගේ, 1999: 75). කුරුල්ලන් දඩයමට පමණක් නොව කුඹුරුවල කෘමි උවදුර දුරලීම පිණිස ද ලැන් තැබීම භාවිත වන අයුරු දැක ගත හැකි ය. ඒ බව හේන් පුරාණයේ මෙසේ දැක්වේ.

මේ සඳහා වුවමනා කරන්නේ දළුක් කිරි පොල් කටු දෙකයි, කොහොල්ලෑ ලොකු ගුලියයි. දුම්මල තෙල් බෝතලයයි. බඹ හතරක් පහක් දිග පොල්කොහු තේඩාවකුයි විතරයි. පළමුවෙන් කොහොල්ලෑ ගුලියත්, දළුක් කිරිත්, ලොකු මහප්පල්ලෙ (ලොකු මැටි ඇතිලිය) කට දමලා ළිපේ තියාපන්. ඒ දෙපන්ගුව හොඳට උණු කරලා ඒකටම දුම්මල තෙල් බෝතලෙත් වක්කරපන්. පුළුවන් නම් කොහොඹ තෙල් පොල් කට්ටකුත් දැම්මොත් වැඩිය හොඳයි. මේ ඔක්කොම ජාති වතුර වගේ උණු වුනාම, තේඩාව දරණු මහප්පල්ලෙට දමාපන්. තේඩාවට මේ මිශ්‍රනය හොඳින් උරා ගත්තට පස්සේ, තේඩාව ඇදලා ගස් දෙකක බැඳපන්, උදේ හිමිදිරියේ මේ ලැන් තැවරිලා තියෙන ලනුව, බඹයක් විතර දිග පොලු දෙකක ඔතාගෙන හේනට ගිහින් ලනුව දිග ඇරලා දෙන්නෙක් පොලු දෙකෙන් අල්ලාගෙන ගොයම් කොළවල ගෑවෙන තරමට පහත් කරලා ඉදිරියට ඇදගෙන යායේ එක කෙළවරක ඉඳලා අනෙක් කෙළවරටත්, ඒ පැත්තේ ඉඳලා මේ පැත්තටත්, දෙපැත්තටම තුන් වතාවක් එක උදේකට ඇද්දොත් ඇති. දුම්මල තෙල් සහ කොහොඹ තෙල්වල ගඳටත්, දළුක් කිරිවල සැරටත් මැස්සෝ ඔක්කොම ගොයම් ගහේ මුලට බහිනවා. ඊට වැඩි මැස්සෝ ප්‍රමාණයක් ලැන් ලනුවේ ඇලිලා මැරෙනවා යනුවෙනි (අප්පුහාමි, 2006: 93).

මෙම ක්‍රමවේදය කුරුල්ලන් දඩයම් කිරීම සඳහා භාවිත කළ ප්‍රධාන ක්‍රමවේදයකි. ඒ ඒ ප්‍රදේශවලට අනුව මේ සඳහා භාවිත අමුද්‍රව්‍යවල හා භාවිත කිරීමේ වෙනස්කම් පවතී.

**02. ගැට ලණුව භාවිත කිරීම**

ගැට ලණුව යනු දුර සිටින කුරුල්ලන් හා වඳුරන්, රිලවුන් දඩයම් කිරීම සඳහා භාවිත කළ හැකි නුග ඇහැටුවලින් සාදා ගන්නා ලද උපකරණයකි. මෙමගින් එය භාවිත කරන්නා වූ පුද්ගලයාගේ ශක්ති ප්‍රමාණයට අනුව ඕනෑ ම දුරකට ඉලක්කයට ගල් ගැසීම සිදු කළ හැකි ය. ගැට ලණුව සාදා ගැනීම සඳහා භාවිත කරනු ලබන්නේ නුග ගස්වල ඇති නුග ඇහැටු ය. එම ඇහැටු ගෙන හොඳින් පොතු හැර පදම් කර ගත යුතු වේ. ඉන්පසු කකුල සහ අත්ල භාවිත කර ඒවායින් ලණුවක් අඹරා ගනු ලබයි. එම ලණුව මැද 'අත්ල' නම් කොටසක් සහ ලණුවේ එක් කෙළවරක එය අතෙහි මහපොට ඇඟිල්ලේ රඳවා ගත හැකි පරිදි රවුමක් සාදනු ලැබේ. එය "මුද්ද" ලෙස හඳුන්වයි. එම ලණුවේ අනෙක් කෙළවර කසයක මෙන් සිහින් කෙඳි සිටින පරිදි අඹරා ගනු ලැබේ. ඉන් අනතුරු මෙය භාවිත කර ගල් ගැසීම සිදු කළ හැකි ය. ඒ සඳහා හොඳින් එය හැසිරවීමට හැකියාව තිබිය යුතු ය.



ලණුවේ වියන ලද එක් කෙලවරක ඇති මුද්ද තමන්ට හුරු අතේ මහපට ඇඟිල්ලට දමා ගත යුතු ය. ඉන් අනතුරුව එම ලණුවේ මැද වියා ඇති ගල් රඳවනය නොහොත් අල්ල උඩින් තමන්ට හැසිර විය හැකි ආකාරයෙන් ගලක් තබා කසයක ආකාරයෙන් ගොතන ලද ලණුවේ අනෙක් කෙළවර එම අතේ ම අත්ලෙන් තදින් අල්ලාගෙන හිස වටා කැරකැවිය යුතු ය. එයින් මුදාහරින ශක්තිය උපයෝගී කර තම අභිමත ඉලක්කයක් සඳහා එහි රඳවා ඇති ගල ගැසීමට හැකියාව පවතී. එසේ සිදු කිරීමේ දී ලණුවේ අග ඇති කසයක් මෙන් තැනූ පැත්ත පමණක් අතින් මුදාහරිනු ලැබේ. එවිට ගල ලණුවෙන් ඉවත් වී ඉලක්කය වෙත යනු ලබයි. මෙම ක්‍රියාවලියේ දී ලණුව කස පුපුරන්නාක් මෙන් ශබ්දය විහිදෙනු ලැබේ. මෙය මනා පුහුණුවකින් සිදු කළ යුක්තකි. මෙය හොඳින් හැසිරවීමට අපහසු තැනැත්තන්ට මෙමගින් ඉලක්කයට ගල් ගැසීම සිදු කළ නොහැකි ය. එහි දී ගසනු ලබන ගල නැවත තමා වෙත වැදීමටත් පිටස්තර පුද්ගලයන්ගේ වැදීමටත් පුළුවන. මෙමගින් ගව්වක දුර නිවැරදි ඉලක්කයට ගල් ගැසීමේ හැකියාව පවතී (ආරියරත්න, 2023).

### 03. කැටපොල්ල භාවිත කිරීම

කැටපොල්ල ද කුරුල්ලන් පන්නා දැමීම හා දඩයම් කිරීමට හැකියාව පවතින හස්තසාර උපකරණයකි. මෙය සෑදීමේ දී ප්‍රථමයෙන් Y හැඩැති ලී කරුවක් ගෙන එහි පොත්ත ඉවත්කර සුද්ද කර ගත යුතු වේ. කරද, නා වැනි ගස්වල කරු ශක්තිමත් බැවින් එම කරුවක් සොයා ගැනීම සුදුසු ය. එය අතට පහසුව ඇල්ලිය හැකි ආකාරයෙන් කපා ගත යුතු ය. ඉන්පසු එක සමාන දිගකින් යුත් රබර් පටි හෝ ටියුබ් පටි දෙකක් කපා ගත යුතු වේ. ඉන් අනතුරුව එළුහම් කැබැල්ලක් හෝ ගෝන හම් කැබැල්ලකින් කැටපොලය සඳහා සුදුසු පරිදි හම් කැබැල්ලක් කපා ගත යුතු ය. එහි කෙළවර දෙකෙහි සිදුරු දෙකක් විද එම සිදුරු දෙකෙහි කපා ගත් රබර් හෝ ටියුබ් පටි දෙකේ කෙළවරවල් දෙක ගැට ගසා ගත යුතු ය. ඉන්පසු එම රබර් හෝ ටියුබ් පටි දෙකේ අනෙක් කෙළවර දෙක ගෙන කපාගන්නා ලද කරුවෙහි ඇති ලී අතු දෙකෙහි ගැටසා ගත යුතු වේ. එවිට කැටපොල්ල නිර්මාණය වෙයි.




මෙය භාවිත කිරීමේ දී තමාට හුරු අතින් කැටපලය අල්ලා පටියේ බඳින ලද හම් කැබැල්ල මත රවුම් ගල් කැට තබා ඇද ඉලක්කය බලා මුදා හරිනු ලබයි. මෙහි ඉලක්කයට ගල් විදීමට නම් කැටපලය හොඳින් ඇද තමන් විදීමට බලාපොරොත්තු වන දෙසට දික් කර ඇසින් ඉලක්කය ගෙන ගල මුදාහැරිය යුතු ව ඇත. මෙමගින් ප්‍රායෝගිකව විද අල්ලාගත හැකි වන්නේ වරකට එක් කුරුල්ලෙක් පමණි. මෙය බහුල ව හේන් හා කුඹුරුවල කුරුල්ලන් පැන්නීම සඳහා යොදා ගනු ලබන්නකි. මෙය ලොකු කුඩා ඕනෑ ම පුද්ගලයෙකුට පොදුවේ භාවිත කළ හැකි දඩයම් උපකරණයක් ලෙස හැඳින්විය හැකි ය. "කුරුල්ලන් හා රිළවුන් පලවා හැරීමට කැටපෝලයෙන් ගල් විදිනු ලැබේ" (කහඳගමගේ, 1999: 66).

## 4. ගල් දුන්න භාවිත කිරීම

කුරුල්ලන් දඩයම් කිරීමට යොදාගන්නා ක්‍රමවේදයන් අතර ගල් දුන්න සුවිශේෂී වේ. මෙම දුන්නෙන් ඊතල නොව ගල් විදින බැවින් ''ගල් විදින දුන්න - ගල් දුන්න'' ලෙස හඳුන්වනු ලැබේ." ගල්කැට ඈතට විදිය හැකි ලෙසට සාදන දුන්න ගල් දුන්න නම් වේ" (කහඳගමගේ, 1999: 65). සාමාන්‍ය දුන්නක දුනුදිය එකකින් යුක්ත වූව ද ගල් දුන්නක දුනුදිය දෙකක් ඇත. කරඳ, හෝ මේරූ පුවක් ගසක් පලා ලබා ගන්නා ලද ලී ගල් දුන්න සෑදීම සඳහා යොදා ගැනේ.

මීටර් එක හමාරක් පමණ දිගින් යුක්ත වූ ඉහත සඳහන් කරන ලද ලීවලින් කැමති ලී වර්ගයක් ගෙන ප්‍රථමයෙන් ලීය හොඳින් සුද්ධ කර ගනී. ඉන්පසු එහි කෙළවර දෙකෙහි අගල් දෙකක පමණ දිගින් යුත් ශක්තිමත් කුඩා ලී කැබලි දෙකක් ගැට ගසනු ලැබේ. ඉන්පසු එම ලී කැබලි දෙකෙහි කොන්වලින් නුග ඇහැටුවලින් හෝ හම්වලින් අඹරන ලද ලණු (දුනුදිය) ගැට ගසනු ලැබේ. එසේ ගැට ගැසීමේ දී ගන්නා ලද ලීය වක්‍රාකාරව නැමෙන අයුරින් තද කර ගැටගසා ගත යුතු ය. ඉන්පසු එම ලණු දෙකෙහි හරි මැද ගල් කැට රඳවා ගැනීමට හැකි වන පරිදි කුඩා කොටුවක ආකාරයේ (අත්ලක්) නුග ඇහුටුවලින් සාදා ගනු ලැබේ. එසේ සාදා ගන්නා ලද ගල් දුන්න භාවිතයට ගැනීමේ දී හුරු අතට දුන්න ගෙන දුනුදියට ගල් කැටයක් තබා දුනුදිය ඇද දුන්නේ ලීය අල්ලා ගෙන සිටින අතේ මහපට ඇඟිල්ලෙන් ඉලක්කය බලා ගල් විදිය හැකි ය.

මෙය කුරුල්ලන් දඩයම සඳහා භාවිත වන ජනප්‍රිය ක්‍රමයකි. "බැලු බැල්මට හී විදින දුන්නේ හැඩය ගනී. දුනුලීය දෙකෙළවර බැඳි වැල් පොටවලින් දුනුලීය නැවී ඇත. දුනුලීය දෙකෙළවර බැඳි වැල්පට දෙක දුනුදිය නම් වේ. දුනුදිය මත ගල් කැටයක් තබා දුනුදිය ඇද, අත්හල විට කැටගල ඈතට විදෙයි" (කහඳගමගේ, 1999: 105). "ගල් දුන්න මිටි දුන්නට වඩා ප්‍රමාණයෙන් කුඩා දුන්නකි. මෙම දුන්නේ දුනුදිය දෙපොටක් ඇත. එහි මැද ගලක් රැඳවීම සඳහා දුනුදිය දෙපොට යාකරමින් පට්ට බැඳ සකසා ඇත. මෙහි ඊතල වෙනුවට ගල් භාවිත කරයි. ගල්වලට අමතරව කණු උල් ද භාවිත කරන අවස්ථා ඇත" (ගුණසේකර, 2018: 61). "කණුඋල යනු ඊතල විශේෂයකි. මෙය සාදා ගැනීමට ගැටවලා ලී බහුලව භාවිත වේ. කණුඋල ප්‍රමාණයෙන් ඊතලයක ප්‍රමාණයට සමාන වේ. මෙහි ඊමුණක් සවි නොකරන අතර ඒ වෙනුවට එහි කෙළවර සියුම් උල් හැඩයට තනා ගනියි. කණුඋලෙහි ද ඊතලයේ මෙන් දුනුදිය රැඳවීම සඳහා කැපුමක් යොදන අතර පිහාටු සවි කිරීම ද සිදු කෙරේ" (එම, 2018: 60-61).



ශ්‍රී ලංකාවේ පළමු වෙනි විශේෂ හා පූර්ණ බලධාරී සෝවියට් තානාපති විලදිමීර් ගියෝර්ගියේවිච් යාකව්ලෙෆ් මහතා 1957 ගේ දින පොත් සටහන් ඇසුරින් නිර්මාණය කර ඇති "ලක්දිව පුරාවත් හා දිවි පෙවෙත (විලදිමීර් යාකව්ලෙෆ්)" කෘතියේ දී ඔහු දුන්නෙන් ගල් විදින ආකාරය ප්‍රථම වරට දුටු බව දක්වා තිබේ. ඒ ශ්‍රී ලංකාවේ දී ය. "දුනුදිය මැද වූ සම් කැබැල්ලකින් කළ නෙරීමෙහි කිකිළි බිත්තරයක් තරම් විශාල වූ රවුම් ගල් කැටයක් තැබූ ඔහු දුනුදිය ඇද අත හැරියේ ය. එය අපට අලුත් තොරතුරක් විය. කැටපෝලයෙන් මෙන් දුන්නෙන් ගල් විදින බව අපි නො දැන සිටිමු" (යාකව්ලෙෆ්, 2000: 274). එසේ ම සෙලිග්මාන් සඳහන් කරන ආකාරයට වැද්දන් ගල් දුන්න භාවිත කරන ආකාරය දක තිබේ. "ගල් දුනු භාවිතය ගෝනබැද්දෙහි දී අපට ද දක්නට ලැබුණේ ය. අසල්වැසි සිංහල මිනිසුන් අතර එය ප්‍රචලිත ව පවත්නා බැවින් වැද්දන්ට ගල් දුන්න පුරුදු වන්නට ඇත්තේ ඔවුන්ගෙන් යැයි සිතිය හැකි ය" (සෙලිග්මාන්, 2009: 150).

## 5. පාමළ භාවිත කිරීම

උෟරන්, ගොන්නුන්, ඕලු මුවන්, හාවන්, ඉත්තෑවන්, මී මින්නා වැනි සිවුපා සතුන් හා වළිකුකුළන්, හබන් කුකුළන්, වටුවන් ආදී කුරුල්ලන් දඩයම් කර ගැනීම සඳහා බහුලව භාවිත කරනු ලබන දඩයම් උගුලක් වන්නේ පාමළ යි. මෙම දඩයම් උගුල පාමළ සහ මරුවැල් පාමළ ලෙස කොටස් දෙකකින් යුක්ත ය. මෙම දඩයම් උගුල නිර්මාණය සඳහා අවශ්‍ය වන්නේ සීමිත ද්‍රව්‍ය ප්‍රමාණයක් පමණි. මේ සඳහා උගුල් ඉන්නක්, ලණුවක් හෝ ශක්තිමත් වැලක්, කණා කුරක්, බට පතුරු කිහිපයක්, ලී කෙක්කක් හා තවත් ලී කෝටු දෙකක් අවශ්‍ය වේ.

### නිර්මාණය කරගන්නා ආකාරය

### පළමු පියවර

ශක්තිමත් දිගින් යුත් ලීයක් ගෙන (උගුල් ඉන්න) එහි කෙළවර සොයාගන්නා ලද ලණුවකින් හෝ වැලකින් සාදන ලද තොණ්ඩුවක් හා ලණු කැබැල්ලකින් කණා කුර ගැට ගැසිය යුතු වේ. ඉන් අනතුරුව තමන්ට අවශ්‍ය ස්ථානයක් බලා එම ලීය හොඳින් සිටුවා ගත යුතු ය.

### දෙවන පියවර

සිටවා ගන්නා ලද උගුල් ඉන්න නවා බලා එහි කෙළවර ලම්භක වන බිම කපාගන්නා ලද කෙක්කක හැඩැති ලීය බිම සිටුවා ගත යුතු ය. එය පොළවේ සිට අගල් පහළවක් පමණ ඉස්සීම ප්‍රමාණවත් වේ. ඉන්පසු උගුල් ඉන්න සිටුවා ගත් පැත්තේ සිට ලීයක් කෙක්ක තුළට දමාගැනීම සිදු කරයි. ඉන් අනතුරුව එම කෙක්ක සහිත ලීයේ සිට අඩියක පමණ දුරින් (දඩයම් කරන සත්ත්වයා අනුව දුර වෙනස් වේ) සිරස් අතට කෙක්කේ උස ප්‍රමාණයට තවත් ලීයක් සිටුවා ගත යුතු ය. එම ලීය හා සිටුවා ගත් කෙක්ක අතරට තිරස් ව ශක්තිමත් කුඩා කොටුවක් (රිකිල්ල) දමාගත යුතු වේ.

### තෙවන පියවර

මූලික පියවරවල් සම්පූර්ණ කළ පසු උගුල් ඉන්න නවාගත

යුතු ය. එහි ගැට ගසා ඇති කණා කූර ගෙන උගුල් ඉන්න සිටුවා ගත් පැත්තේ සිට කෙක්ක තුළට දමා ඇති ලීයේ කණා කූරේ ලණුව ගැටගසා ඇති පැත්ත රඳවා අනෙක් පැත්ත කෙක්කත් සිරස් ව සිටුවා ගත් කණුව අතර තිරස් ව දමා ඇති රිකිල්ලේ රඳවා ගත යුතු වේ. එවිට උගුල් ඉන්න දුන්නක් මෙන් නැවී තිබෙනු දැකිය හැකි වේ. එමෙන් ම රිකිල්ල පොළව මට්ටමෙන් මදක් ඉස්සී තිබේ.

## සිවුවන පියවර

ඉන් අනතුරුව ඉතා කල්පනාකාරීව උගුල් ඉන්නේ ගැටගසා ඇති තොණ්ඩුව ගෙන කෙක්කත්, සිරස්ව සිටුවාගත් කණුව අතර ඇති රිකිල්ල උඩින් රවුමට දමාගත යුතු වේ. ඉන්පසු පලා ගන්නා ලද බට පතුරු ගෙන පල දෙකක් ඇති නිවසක වහලය මෙන් රිකිල්ලේ දෙපැත්තට අසුරනු ලැබේ. එසේ ම වියලුණු කොළ රොඩු ගෙන දමා ඇති තොණ්ඩුව වසා දැමීම ද සිදු කරණු ලබයි.



මෙහි ක්‍රියාකාරීත්වය සිදුවන්නේ කිසියම් හෝ සතෙකු එම උගුලේ රිකිල්ල හරහා ගමන් කිරීමේ දී එය පෑගීමෙන් අනතුරුව රිකිල්ලෙන් කණා කූර ගිලිහෙනු ලැබේ. එවිට කණා කූරෙන් රඳවා

ඇති උගුල් ඉන්න ගැස්සී ඉහළට එසවෙනු ලැබේ. එය එසවීමේ වේගයත් සමඟ රිකිල්ල වටා දමා තිබූ තොණ්ඩුව සත්ත්වයාගේ කකුලට පැටලෙනු ලැබේ. ඉන් අනතුරුව සතා කකුලෙන් උඩ එල්ලෙනු ඇත. ඇතැම් අවස්ථාවල සිරුරෙන් කකුල ගැලවී යන අවස්ථා ද දැකිය හැකි ය. එය උගුල් ඉන්න ගැස්සීමේ වේගය අනුව සිදුවන්නකි.

## 5.1. මරුවැල් පාමළ

සාම්ප්‍රදායිකව සතුන් දඩයම් කිරීම පිණිස භාවිත තවත් එක් දඩයම් උගුලක් ලෙස මරුවැල් පාමළ හැඳින්විය හැකි ය. මෙම පාමළ සෑදීම සඳහා පාමළට අවශ්‍ය කරන ද්‍රව්‍ය ද ලබා ගත යුතු වේ. පාමළ නම් උගුල් ක්‍රමයෙන් මෙය වෙනස් වන්නේ පාමළ ක්‍රියාත්මක වීමට රිකිල්ල හෙවත් කුඩා ලී කෝටුවක් භාවිත කිරීමත් මරුවැල් පාමළ ක්‍රියාත්මක වීමට මරුවැලක් භාවිත කිරීමත් වේ. මෙම උගුල ඕනෑ ම සිවුපා හා පක්ෂි දඩයම සඳහා භාවිත කළ හැකි ය.



**නිර්මාණය කරගන්නා ආකාරය**

**පළමු පියවර**

ශක්තිමත් උගුල් ඉන්නක් ගෙන එහි තොණ්ඩුවක් සහ කණා

කූරක් ගැට ගැටගැසිය යුතු ය. එය සතෙකු ගමන් ගන්නා මාර්ගයක හෝ ස්ථානයක් සොයා සිටුවා ගත යුතු වේ. ඉන්පසු එය නවා එහි කෙළවර පොළවට ලම්භක වන ස්ථානයේ බිම සළකුණු කර ගත යුතු ය. එතැන් සිට අඩියක් පමණ දුරින් තරමක් උස ලී කෝටුවක් සිටුවා ගත යුතු වේ. එය මරු කණුව ලෙස හඳුන්වයි.

**දෙවන පියවර**

ඉන්පසු ප්‍රථමයෙන් පොළව සලකුණු තබා ගත් ස්ථානයේ සිට උගුල් ඉන්න දෙසට අගල් කිහිපයක් පසුපසට වන්නට අඩියක් පමණ උසින් යුත් ලී කැබලි දෙකක් (දඩයම් කරන සත්ත්වයා අනුව උස වෙනස් වේ) සිටුවා ගත යුතු වේ. එසේ සිටවා ගත් ලී දෙකේ කෙළවරින් හරහට ලීයක් ගැට ගසනු ලබයි.

**තෙවන පියවර**

ඉන් අනතුරුව දෙවන පියවරේ සිටුවා ගැට ගසා ගත් ලීයට යටින් උගුල් ඉන්න දෙසට ලීයක් දමා ගත යුතු වේ. එසේ දමා ගත් ලීය පිටුපසින් ලී කරුවක රඳවනු ලැබේ. එම ලීයේ එක් කෙළවරක් උගුල් ඉන්න නවා සළකුණු කර ගත් ස්ථානයේ තැබිය යුතු ය.

**සිවුවන පියවර**

ඉන්පසු වේවැල් හෝ කුකුළු වේවැල්වලින් කුඩා රවුමක් සාදා ගත යුතු වේ (විවිධ ප්‍රදේශවල සොයාගත හැකි වැල් වර්ගවලින් මෙය සාදා ගනී). එම රවුම තුන්වන පියවරේ ගැටගසා ගත් ලීයට යටින් දමන ලද ලීයේ කෙළවරට දැමිය යුතු ය. එලෙස සාදාගත් රවුමට කිතුල් කෙඳිවලින් අඹරන ලද ලණුවක් (මරුවැල) ගැටගසනු ලබයි. එම මරුවැලේ එක් කොණක් පළමු පියවරේ සිටුවාගත් මරු කණුවේ ගැට ගසනු ලැබේ.

**පස්වන පියවර**

ඉහත පියවර කිහිපය සම්පූර්ණ වූ පසු උගුල් ඉන්න නවා එහි ඇති කණා කූර ලීයේ රඳවා ඇති වැල් රවුමේ රඳවනු ලැබේ. ඉන්පසු උගුල් ඉන්නේ ඇති තොණ්ඩුව ගෙන කවාකාරව බිම එලනු ලබයි.

මෙහි ක්‍රියාකාරිත්වය සිදු වන්නේ කිසියම් හෝ සතෙකු උගුලේ සිට මරු කණුවේ ගැටගසා ඇති මරුවැල ඇති ප්‍රදේශයෙන් ගමන් ගන්නා විට මරුවැල එම සත්ත්වයාගේ ඇගේ පැටලෙයි. එවිට එම වැලේ ගැටගසා ඇති වැල් රවුම ඉදිරියට ඇදේ. එම මොහොතේ වැල් රවුමේ රදවා ඇති කණා කුර ඉවත් වේ. කණා කුරෙන් උගුල් ඉන්න රදවා ඇති බැවින් වැල් රවුමෙන් නිදහස් වූ පසු උගුල් ඉන්න ගැස්සෙයි. එවිට බිම එළා ඇති තොණ්ඩුව සත්ත්වයාගේ කකුල්වල පැටලීම සිදු වේ.

## 6. ඇඳි උගුල භාවිත කිරීම

ඇඳි උගුල ද සිවුපා සතුන් මෙන් ම කුරුල්ලන් දඩයම් කිරීමට පොදුවේ භාවිතයට ගත හැකි සාම්ප්‍රදායික දඩයම් උගුලකි. මෙම උගුල විශේෂයෙන් අධ්‍යයන ප්‍රදේශයේ භාවිත වන්නේ වළිකුකුළන්, හබන් කුකුළන්, වටුවන් හා කොරවක්කන් ඇල්ලීම පිණිස ය. මෙය නිර්මාණය කර ගැනීම සඳහා ශක්තිමත් ලී කෝටු කිහිපයක් සහ වැල් හෝ ලණු කැබලි කිහිපයක් අවශ්‍ය වේ.

### නිර්මාණය කරගන්නා ආකාරය

### පළමු පියවර

ප්‍රථමයෙන් සතුන් ගමන් ගන්නා මාර්ගයක් (අහරක්) හෝ ගැවසෙන ස්ථානයක් සොයා ගත යුතු වේ. ඉන්පසු කපා ගන්නා ලද ලී කෝටුවලින් එක සමාන උස ඇති ලී කෝටු හතරක් ගෙන අඩියක් පමණ පරතරය වන පරිදි (සතාගේ ප්‍රමාණය අනුව වෙනස් වේ) එක පැත්තකට කෝටු දෙක බැගින් (එක පැත්තක කෝටු දෙකක් අතර පරතරය අගල් 6ක් පමණ වේ) කෝටු හතර සිටුවා ගත යුතු ය. ඉන්පසු ලී දෙක බැගින් හසුවන පරිදි හරස් අතට තවත් ලී කෝටු දෙකක් උඩින් ගැට ගසනු ලබයි. ඉන් අනතුරුව ලී කෝටුවක් ගෙන සිටවා ගන්නා ලද කෝටු හතර අතරින් තිරස්ව බිම් මට්ටමින් තබා ගත යුතු වේ. එය ගැට නොගසයි. එය රිකිල්ල ලෙස හඳුන්වයි.

## දෙවන පියවර

ඉන්පසු ශක්තිමත් දිගින් යුත් ලීයක් ගෙන එහි තොණ්ඩුවක් සහ කණාකුරක් ගැට ගසා ගත යුතු වේ. එම ලීය 'උගුල් ඉන්න' නම් වේ. එම ලීය ප්‍රථමයෙන් සිටවන ලද ලීවල එක් පසෙකට වන්නට සිටුවා ගත යුතු ය.

## තෙවන පියවර

තුන්වන පියවර ලෙස සිටුවා ගන්නා ලද උගුල් ඉන්න නවා එහි ඇති කණා කූර පළමු පියවරේ සිටවන ලද ලී කෝටුවල උඩින් ගැට ගසා ඇති ලීයක රඳවා එම පියවරේ ම ගැට නොගසා තබා ඇති ලී කොටුවේ (රිකිල්ලේ) පොළව මට්ටමින් අගල් භාගයක් පමණ උස්සා එහි රඳවනු ලැබේ.

## සිවුවන පියවර

අවසාන පියවර ලෙස උගුල් ඉන්නේ ඇති තොණ්ඩුව ගෙන කවාකාරව ප්‍රථම පියවරේ සිටුවා ගන්නා ලද ලී අතරින් දමා ගත යුතු වේ.

මෙම උගුලේ ක්‍රියාකාරීත්වය සිදුවන්නේ ඉහත කී පරිදි සාදා ගන්නා ලද උගුල අතරින් සතෙකු ගමන් කිරීමේ දී ගැට නොගසා උස්සා කණා කූරේ රඳවා ඇති ලීය (රිකිල්ල) පහළට තද වේ. එවිට එහි රඳවා ඇති කණා කූර එයින් මිදෙනු ලැබේ. එවිට නවා ඇති උගුල් ඉන්න ගැස්සෙයි. එවිට ලී හතර අතරින් දමා ඇති තොණ්ඩුව තද වේ. එම තොණ්ඩුවට සතා අසු වේ. මෙම ක්‍රමය ද බහුලව භාවිත වන සාම්ප්‍රදායික දඩයම් උගුල් ක්‍රමයකි.

## 07. කූඩ ඇටවීම


වියාගන්නා ලද කූඩයක් ගෙන එහි පිටුපස දිගින් යුක්ත වූ ලණුවක් ගැට ගසනු ලැබේ. ඉන්පසු කරු දෙකක් හෝ ගල් දෙකක් දෙපැත්තෙන් ඒ මත තිරස්ව ලීයක් දමාගත යුතු වේ. එම ලීයේ හරි මැදින් ලණුවෙන් කූඩය ඉහළ- පහළ කළ හැකි පරිදි කූඩය තබා ගත යුතු වේ. ඉන්පසු එම කූඩය යටට හාල්, බත් වැනි කුරුල්ලන්ට කෑමට

යමක් දැමිය යුතු ය. ගසකට මුවා වී හෝ කුරුල්ලන්ට නොපෙනෙන සේ හැංගී සිට කුඩයේ ගැට ගසා ඇති ලණුව මගින් කුඩය උස්සා තබා ගත යුතු වේ. කුරුල්ලන් කුඩය යටට ඇවිත් කෑම ගන්නා විට අතින් ලණුව මුදා හරිනු ලබයි. එවිට කුඩයෙන් කුරුල්ලන් වැසෙයි.



08. කුල්ල ඇටවීම

මෙම ක්‍රමය ද කුරුල්ලන් නොමරා අල්ලා ගැනීම සඳහා භාවිත කරන තවත් එක් ක්‍රමවේදයකි. කුල්ලක් ගෙන එය 450ක් පමණ ඇලයට තබා කෝටුවක් ගෙන එහි ඉදිරිපසින් තබා කුල්ල නොවැටෙන සේ රදවා ගත යුතු වේ. ඉන් අනතුරුව රදවනයට තබා ගත් කොටුවේ මැදින් දිගින් යුක්ත වූ ලණුවක් ගැට ගසනු ලබයි. කුල්ල ඇතුළට හාල්, වැනි කුරුල්ලන්ට කෑමට යමක් දමා කුරුල්ලන් ඒ තුළට යන තෙක් ලීයේ ගැට ගසා ඇති ලණුව ගෙන සැඟවී බලා සිටිය යුතු ය. කුරුල්ලන් ඇවිත් ආහාර ගන්නා විට ලනුව අදිනු ලබයි. එහිදී කෝටුවෙන් කුල්ල ගිලිහී කුරුල්ලන් ආවරණය වීම සිදු වේ. ඉන්පසු එම කුරුල්ලන් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමට හැකියාව පවතී.



**සමාලෝචනය**

අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගත් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ගුරුබැවිලාගම ග්‍රාම නිලධාරී වසම තුළ වාසය කරන මිනිසුන් විසින් පක්ෂීන් දඩයම කිරීම සඳහා ක්‍රමවේද රාශියක් භාවිත කර තිබේ. එම ක්‍රමවේදයන් ද ප්‍රවේණියෙන් ප්‍රවේණියට උරුම වූවකි. වෘත්තියක් වශයෙන් දඩයම් කරන පුද්ගලයින් මෙම ප්‍රදේශයේ දක්නට නොමැත. වගාවලට සතුන්ගෙන් සිදුවන හානි වළක්වා ගැනීම, ආහාර අවශ්‍යතා සඳහා මස් මාංශ ලබා ගැනීම හා විනෝදය යන අරමුණු ඇතිව මෙම ප්‍රදේශයේ මිනිසුන් දඩයමට හුරු වී තිබේ.

දඩයම් ක්‍රමවේද අතර දඩයම් උගුල්වලට හිමිවන්නේ ප්‍රමුඛ ස්ථානයකි. දඩයම් උගුල් නිර්මාණය සඳහා මනා පරිචයක් තිබිය යුතු ය. එම පරිචය ප්‍රායෝගිකව දඩයම් උගුල් ඇටවීමෙන් පමණක් ලබා ගත හැකි වේ. දඩයම් උගුල් ඇටවීම බහුලව සිදු කර ඇත්තේ හේන් ආශ්‍රිතව ය. එම හේන් වර්තමානයේ දැකිය නොහැකි වුව ද වර්තමානයේ එම හේන් ආශ්‍රිතව සිදු කළ දඩයම් ක්‍රම පිළිබඳ දැනීම ඇති අතළොස්සක් පමණ මෙම ප්‍රදේශයේ ජීවත් වෙති. සාම්ප්‍රදායික දඩයම් උගුල් ආදිය නිර්මාණය කිරීම සඳහා භාවිත වන්නේ අවට

පරිසරයෙන් සොයාගන්නා ලද ලී දඬු, වැල්, ගල්, ආදියයි. ඉතා සියුම් ආකාරයෙන් උගුල් නිර්මාණය කිරීමටත්, ප්‍රායෝගිකව භාවිත කළ හැකි අයුරින් දඩයම් උපකරණ නිර්මාණය කිරීමත් ගැමියෝ සමත්කම් දක්වති.

දඩයම් උගුල් භාවිතයෙන් ප්‍රායෝගිකව වරකට අල්ලා ගත හැකි වන්නේ එක් සත්ත්වයෙකු පමණි. එම නිසා සත්ත්ව සන්තතිය එක වර විනාශ වීමක් සිදු නොවේ. එසේ ම දඩයම් කිරීමට අපේක්ෂිත සත්ත්වයාට සුදුසු උගුල් වර්ගය කවරේ ද යන්න තෝරා එමගින් එම සත්ත්වයා අල්ලා ගැනීමට තරම් හැකියාවක් උගුල් අටවන්නන් සතු ව පවතී. එම උගුල් ඇටවීමේ දී සත්ත්වයාගේ උස, විශාලත්වය, ගමන් කරන වේලාවන්, ගමන් කරන මාර්ග හා කෑමට රුචි කරන ආහාර වර්ග පිළිබඳව ද අවබෝධය ගැමියන් සතුව පවතී. දඩයම් උගුලක් ඇටවීමේ දී එහි ක්‍රියාකාරීත්වය ක්‍රම කිහිපයකට සිදු වේ. එනම් මරුවැල මගින් උගුල ගැස්සීම, කණකූර හා රිකිල්ල මගින් උගුල ක්‍රියාත්මක වීම හා සත්ත්වයා විසින් ඇදගෙන යාමේ දී එය ක්‍රියාත්මක වීමයි. බහුලව භාවිත වන ක්‍රම ද්විත්වය වන්නේ කණකූර හා රිකිල්ල භාවිතය සහ මරුවැල් භාවිත වීම ය.

එසේ ම පක්ෂි දඩයම සඳහා යොදාගන්නා දඩයම් ක්‍රමවේදයන් අතර බහුලව භාවිත වන්නේ දඩයම් උපකරණය. ඒ සියල්ල මනා නිමාවකින් යුක්තව නිර්මාණය කරනු ලබයි. මේ සඳහා ද භාවිත වන්නේ අවට පරිසරයේ ඇති ද්‍රව්‍ය වේ. කැටපලය සෑදීමට පමණක් රබර් පටි යොදා ගනී. දුනු වර්ග රාශියක් දක්නට ලැබුන ද අධ්‍යයන ප්‍රදේශයේ දක්නට ඇත්තේ ගල් දුන්න පමණි. අනෙක් දුනු සෑදීමට නිවැරදි තාක්ෂණයක් හෝ ශිල්පීය ක්‍රමයක් දැන ගැනීමට නොහැකි විය. අනෙකුත් දඩයම් ක්‍රම ද මෙම සමාජයෙන් වියෙකෙමින් පවතී.

ඉහත දක්වන ලද දඩයම් ක්‍රම අධ්‍යයන ප්‍රදේශයේ කුරුල්ලන් දඩයම් කර ගැනීම සඳහා භාවිත කර ඇත. එහෙත් වර්තමානයේ කැටපලය හා කුල්ල ඇටවීම පමණක් මෙම ප්‍රදේශයේ භාවිත වන අකාරය දැක ගත හැකි ය. කැටපලය කුරුල්ලන් දඩයම් කිරීමට නොව කුරුල්ලන් පන්නා දැමීමට භාවිත වේ. කුල්ල ඇටවීම විනෝදය සඳහා නිවෙස් අසලට එන කුරුල්ලන් ඇල්ලීම සඳහා භාවිත කරයි. එම

කුරුල්ලන් මරණයට පත් නොකර නැවත මුදා හරිනු ලැබේ. අනෙක් සියලුම කුරුල්ලන් ඇල්ලීමේ ක්‍රමවේදයන් මෙම ප්‍රදේශයෙන් ඈත් වී ගොස් තිබේ.

## ආශ්‍රිත මූලාශ්‍රය


අප්පුහාමි, කේ. බී. (2006). *හේන් පුරාණය*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, පියදාස. (1999). *හේනේ විත්ති*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

කහඳගමගේ, සන්ධ්‍යා. (2011). *ගොවි බස*. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

ගුණසේකර, උමයංගනා පූජනී. (2018). *වැදි ජනයාගේ සාම්ප්‍රදායික ආහාර තාක්ෂණය*. කොළඹ:

සූරිය ප්‍රකාශකයෝ.

ජයවර්ධන, මධුරසිරි. (2009). *හෙළ ආදිවාසික සිරිත් විරිත්*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නාරද හිමි, දෝතළුඔය. (2024). *සාම්ප්‍රදායික දඩයම් කලාව පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්*. ශාස්ත්‍රපති ගෞරව උපාධි පාඨමාලාවට ඉදිරිපත් කරන ලද ස්වාධීන නිබන්ධය (අප්‍රකාශිත).

නාරද හිමි, දෝතළුඔය. (2022). *ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික දඩයම් උගුල් පිළිබඳ අධ්‍යයනයක්*. 7th Undergraduate Research Symposium on Archaeology Rajarata University of Sri Lanka.

සෙලිග්මාන්, (2009). *වැද්දෝ* (The vaddas) (සිංහල පරිවර්තනය - නිශ්සන්ක පෙරේරා), කොලඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

සෙල්ග්මාන්. (1973). *ලංකාවේ වැද්දො* (සිංහල පරිවර්තනය - ඊ.එම්. රත්නපාල), වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ.

යාකව්ලෙෆ්, විලදිමීර්. 2000). *ලක්දිව පුරාවත් හා දිවි පෙවෙත* (සිංහල පරිවර්තනය - රන්ජන් සේනාසිංහ), සූරිය ප්‍රකාශකයෝ.